ih, yulu wejrK
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

6 ශ්‍රේණිය

# ඉතිහාසය

කාලය පැය 2 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- ගැළපෙන වචන යොදා පහත අංක 01 - 05 දක්වා වූ ප්‍රකාශනවල හිස්තැන් පුරවන්න.

01 ගංගා දෙකක් මැදිවනසේ පිහිටා තිබූ පැරණි ශිෂ්ටාචාරය ........................................................ ශිෂ්ටාචාරය නමින් ද හඳුන්වා තිබේ.

02 ඊජිප්තුවේ අක්හෙනතන් රජු මියයාමෙන් පසුව ඒ රජුගේ බිසව වූ .................................. රැජින කෙටි කලක් රට පාලනය කළාය.

03 විජය නමින් හැඳින්වෙන කුමාරයෙකු ඔහුගේ පිරිවර හත්සියයක් දෙනා සමග පැමිණ මේ රටේ පදිංචි වූ බව ......................................................... නම් ඓතිහාසික මූලාශ්‍ර ග්‍රන්ථයේ සඳහන් වේ.

04 පූරා ශිලා යුගයේ පටන්ම මිනිස්සු මියගිය ඥාතීන්ගේ ඇටසැකිළි මත ................................................ ආලේප කිරීමට පුරුදු වූහ.

05 මීට අවුරුදු දශ ලක්ෂ එක්දහස් අටසියයකට ඉහත කාල වකවානුවක දී හෝමෝ ඉරෙක්ටස් මානවයා පළමුවරට ....................................................... භාවිත කළ බවට සාක්ෂි ඊශ්‍රායලයෙන් හමුවී ඇත.

- අංක 06 - 10 දක්වා වූ ප්‍රකාශන හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06 පෘථිවියේ අභ්‍යන්තර උෂ්ණත්වය 6000C$^{o}$ ක් පමණ වෙතැයි ගණන් බලා තිබේ. (    )

07 පූරා ශිලා යුගයේ දී මෙන් නොව මධ්‍ය ශිලා යුගයේ දී මිනිසා ලෝහ භාවිතයට පුරුදු වූහ. (    )

08 අප කවුරුත් හෝමෝ සාපියන් වර්ගයට අයත් වන මුත් ඇතැම් ප්‍රදේශවල ජීවත් වන

මිනිසුන්ගේ මුහුණුවල වෙනස්කම් පවතී. ( )

09 මාලිමා යන්ත්‍රය, කඩදාසි හා වෙඩි බෙහෙත් මුලින්ම ලෝකයට හඳුන්වා දෙන ලද්දේ චීන ජාතිකයින් විසිනි. ( )

10 පැරණි මෙසපොතේමියානු සමාජයේ සිටි බලවත්ම පිරිස ඉහළ පන්තිවලට අයත් පිරිමි අය වූහ. ( )

- වරහන් තුළ දී ඇති පිළිතුරු අතුරින් හිස් තැනට ගැළපෙන නිවැරදි පිළිතුර සොයා යටින් ඉරක් අඳින්න.

11 දියුණු ජල-නල පද්ධති සහිත සැළසුම් කළ නිවාසවල ........................................ වාසීහු ජීවත් වූහ. (ඉන්දු නිම්න / නයිල් නිම්න / මෙසපොතේමියානු)

12 අතීතයේ එක් එක් රටවල විසූ මිනිසුන් විවිධ ධාන්‍ය වර්ග වගාවට පුරුදු වූ අතර වී වගාව මුල් වරට ආරම්භ වූ රට ........................................................................................ යි. (චීනය / මධ්‍යධරණී ප්‍රදේශය / මධ්‍යම මෙක්සිකෝව)

13 පැරණි ඊජිප්තු ජනයා විසින් භාවිත කර ඇති අක්ෂර ක්‍රමය ........................................ නමින් හඳුන්වනු ලැබේ. (චිත්‍රාක්ෂර / කූඤ්ඤාක්ෂර / රූපාක්ෂර)

14 ගලින් කළ මෙවලම් වැඩි වශයෙන් භාවිත කර ඇති යුගය ........................................ ලෙස සැළකේ. (දඩයම් යුගය / ගොවි යුගය / ගල් යුගය)

15 මධ්‍යධරණී ප්‍රදේශයේ තිරිඟු වගාව මුලින්ම ආරම්භ කරන ලද්දේ ........................................ තරම් ඈත කාලයකදී ය. (ක්‍රි.පූ. 3000 / ක්‍රි.පූ. 9000 / ක්‍රි.පූ. 7000)

- මේ සමග පහළින් ඉදිරිපත් කර ඇති පින්තූර ප්‍රයෝජනයට ගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(1)

16 අංක 1 පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

..........................................................................................

17 එය අයත්වන ශිෂ්ටාචාරය කුමක් ද?

..........................................................................................



(2)

18 අංක 2 න් පෙන්වන පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද? ..........................................................................

19 එම පින්තූරයේ නිරූපණය කර තිබෙන ලක්ෂණයක් ලියන්න. ............................................

(2 x 20 = 40)

20 මෙය කවර ශිෂ්ටාචාරයකට අයත්වීද?

.................................................................................

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01 (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය වර්ධනය වී තිබෙන්නේ පැරණි ඉන්දියාවේ ය. එහි තිබූ ප්‍රධාන නගර 2 ක් ලියන්න. (ල. 02)

A



(ii) මේ සමග A අක්ෂරයෙන් පෙන්වා තිබෙන්නේ එම ශිෂ්ටාචාරයෙන් සොයාගන්නා ලද මූර්තියකි.

(a) එහි නළලේ ඇති පටියෙන් හඟවන්නේ කුමක් ද?

(b) ඇස් අඩවන් ලෙස තිබීමෙන් හඟවන්නේ කුමක් ද? ( ල . 04)



B

(iii) (a) මේ සමග ඇති B අක්ෂරයෙන් පෙන්නුම් කරන පින්තූරයේ දැක්වෙන්නේ කුමක් ද?

(b) එය කවර ශිෂ්ටාචාරයකට අයත්වේ ද?

(c) එය පිහිටා තිබෙන ස්ථානය නම් කරන්න.

(d) මේවා ඉදිකර ඇත්තේ කුමන අරමුණක් සඳහා ද?

(e) මෙම ගොඩනැගිලි අයත්වන කාල සීමාව නම් කරන්න.

(f) මේවායේ වැදගත්කම දැක්වෙන ප්‍රකාශනයක් ලියන්න. (ල. 06)

02 (i) මෙරට මුල් ජනාවාස ඇතිවූ යුගයේ (දඩයම් යුගයේ) මිනිසුන් වාසය කළ බවට තොරතුරු ලැබී තිබෙන ස්ථානයක් සඳහන් කරන්න. (ල. 02)

(ii) එකල ජනයා ආහාරයට ගත් දේවල් 4 ක් ලියන්න. (ල. 04)

(iii) (a) ඔවුන් අවමංගල චාරිත්‍ර ඉටුකර ඇති ආකාරය දැක්වීමට කරුණු 3 ක් ලියන්න.

(b) ආභරණ පිළියෙල කරගෙන ඇති ආකාරය ගැන කරුණු 3 ක් ලියන්න.

(ල. 06)

03 (i) ඉන්දියාවෙන් මෙරටට පැමිණි මුල්ම ආර්ය කණ්ඩායම නම් කරන්න. (ල. 02)

(ii) (a) එම පිරිස ගොඩබසින ලද ස්ථානය කුමක් ද?

(b) එම පිරිස පදිංචි වූයේ කුමන ගංගාවක් ආශ්‍රිතව ද?

(c) ඔවුන් පිහිටුවාගත් ගම්මාන 2 ක් නම් කරන්න. (ල. 04)

(iii) ඔවුන් පැමිණ මේ රටේ පදිංචි වූ ආකාරය දැක්වීමට කරුණු 6 ක් ලියන්න. ^ ,' 06&

The National e-learning Portal for The General Education

04 (i) පුරා ශිලා යුගයේ ජනයා සිය ජීවනෝපාය පිණිස ආහාර සපයාගත් ක්‍රම 2 ක් දක්වන්න. ( ල. 02)

(ii) මධ්‍ය ශිලා යුගයේ දී පුරා ශිලා යුගයට වඩා ආහාර සපයාගැනීම සම්බන්ධයෙන් ඇතිවූ වෙනස්කම් 2 ක් ලියන්න. ( ල. 04)

(iii) (a) නව ශිලා යුගයේ මිනිසා භාවිතයට ගත් ආහාර වර්ග 3 ක් ලියන්න.